# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2476/04 – 2026 පෙබරවාරි මස 16 වැනි සඳුදා – 2026.02.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2025 අංක 146 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/2/2015/Z/62.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KEG/RBK/LL/AQURE/D55/02/01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම්අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම් භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

2025 නොවැම්බර් මස 21 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කරගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, රඹුක්කන.

II. **ඉඩමේ විස්තරය.** – සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 09B, යෝදගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, යෝදගම ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක මු.පි.කෑ. 3780, හා 2020.07.29 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක 1 - දෙල්ගහකුඹුරහේන - ප්‍රමාණය: හෙක්. 0.1723**

උතුරට: කෑ 3483 වැනි මූලික පිඹුරේ කැබලි අංක 1; නැගෙනහිරට: එන්.පී.ඩී.එස්. නිශ්ශංක හිමිකම් කියන දෙල්ගහ මූලහේන සහ ඩබ්.එම්.ඩී.ඒ.බී.වීරසේකර හිමිකම් කියන දෙල්ගහකුඹුරහේන; දකුණට: ඩබ්.එම්.ඩී.ඒ.බී.වීරසේකර හිමිකම් කියන දෙල්ගහකුඹුරහේන, එස්.ඊ . බක්මීවැව හිමිකම් කියන දේගහකුඹුරහේන, එච්.පී. ගුණතිලක හිමිකම් කියන දෙල්ගහකුඹුරහේන සහ බී.ඩබ්.එම්.පී.ජේ. එම්. බරනගල හිමිකම් කියන දෙල්ගහකුඹුරහේන; බටහිරට : ආර්.ඒ.වික්ටර් විජේසේන හිමිකම් කියන මූකලන්අත්තේහේන.

EOG 02 – 0128

1A – G 046304 – 13 (2026/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2025 අංක 147 දරන ආඥාව**

මගේ යොමු අංකය : 13/97/FR/252.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/MDB/4/2/1/79/11.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිජේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම, පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කරගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම් භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2026 ජනවාරි මස 05 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කරගැනීමේ නිලධාරී.** – ප්‍රාදේශීය ලේකම්, මැදදුම්බර.

II. **ඉඩමේ විස්තරය.** – මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩසියපත්තුව දකුණු කොරළේ සුළු කොට්ඨාසයේ කන්දේකුඹුර (802) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නමදගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද පිඹුරු අංක මහ 6596 හා 2016.08.12 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණවලින් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

**01. කැබලි අංක 1 - දෙල්පටන්ඔය වත්ත - ප්‍රමාණය: හෙක්. 6.0604**

උතුරට: මාර්ගය, රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන දෙල්පටන්ඔය වත්ත සහ කැබලි අංක 2; නැගෙනහිරට: කැබලි අංක 2 සහ ඇළ; දකුණට: ඇළ, මු.පි. මහ 1799 හි කැබලි අංක 2 සහ රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන දෙල්පටන් ඔය වතත;බටහිරට : මු.පි.මහ 1799 හි කැබලි අංක 2, රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන දෙල්පටන්ඔය වත්ත සහ මාර්ගය.

**02. කැබලි අංක 2 - ප්‍රමාණය:හෙක්. 0.1380**

උතුරට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන දෙල්පටන්ඔය වත්ත සහ කැබලි අංක 3; නැගෙනහිරට: කැබලි අංක 3; දකුණට: ඇළ සහ කැබලි අංක 1; බටහිරට: කැබලි අංක 1.

**03. කැබලි අංක 3 - දෙල්පටන්ඔය වත්ත - ප්‍රමාණය: හෙක්. 10.2800**

උතුරට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන මිරිස්කැටිය වත්ත; නැගෙනහිරට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන මිරිස්කැටිය වත්ත සහ දෙල්පටන්ඔය වත්ත; දකුණට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන දෙල්පටන්ඔය වත්ත, දෙල්පටන්ඔය සහ මු.පි.මහ 1799 හි කැබලි අංක 3;බටහිරට : මු.පි.මහ 1799 හි කැබලි අංක 3, ඇළ සහ කැබලි අංක 4 සහ 2.

**04. කැබලි අංක 4 - ප්‍රමාණය:හෙක්. 0.0408**

උතුරට: කැබලි අංක 3 සහ ඇළ; නැගෙනහිරට, දකුණට සහ බටහිරට : කැබලි අංක 3.

EOG 02 – 0129

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.